දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

First Year (100 Level) Examination in Bachelor of Arts (External New Syllabus)
(August 2018)

# ECNE 101: ආර්ථික විද්‍යාව හැඳින්වීම (Introduction to Economics)

*උපදෙස්*

ඕනෑම ප්‍රශ්ණ **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

කාලයඃ **පැය තුනයි.**

සෑම ප්‍රශ්නයකටම ලකුණු 25 ක් හිමි වේ.

ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

---

1. i. ආවස්ථික පිරිවැය (opportunity cost) යන සංකල්පය නිර්වචනය කොට එය තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුල දී නිතරම වැදගත් වන්නේ ද යන්න පැහැදිළි කරන්න.

   ii. නිෂ්පාදන හැකියා මායිම (මායිම් වක්‍රය) නිර්වචනය කොට, හිඟකම නිරූපනය කිරීම සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය යොදා ගත හැකි වන්නේ කෙසේද යන්න පැහැදිළි කරන්න.

   iii. වැඩිවන, හීනවන සහ ස්ථාවර ආවස්ථික පිරිවැය යන සංකල්පයන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයන් භාවිතා කොට පැහැදිළි කරන්න.

   v. වෙළඳපොල ආර්ථිකයක් තුල පවත්නා ප්‍රධාන ලක්ෂණයන් හතරක් හඳුනාගන්න. එහි වාසි සහ අවාසි පැහැදිළි කරන්න.

   iv. "ආර්ථික සානුබලයන් (economic incentives) මූල්‍යමය හෝ මූල්‍යමය නොවන ඒවා විය හැකිය" ඔබ එකඟ වන්නේද? සුදුසු උදාහරණයන් භාවිතා කොට පැහැදිළි කරන්න.
   (එක් කොටසකට ලකුණු 5 කි)

2. i. කිසියම් භාණ්ඩයක වෙලඳපොළ ඉල්ලම් හා සැපයම් දැක්වෙන සමීකරණයන් පහත ලෙස දක්වා ඇත.

$$Q^d = 200 - 10P$$
$$Q^s = -100 + 20P$$

   අ. රූප සටහනක ඉල්ලුම් හා සැපයුම් වක්‍රයන් නිර්මාණය කරන්න. (ලකුණු 2)

   ආ. සමතුලිත මිල හා ප්‍රමාණය ගනනය කරන්න. (ලකුණු 2)

   ඇ. රජය විසින් මෙම භාණ්ඩය සඳහා රුපියල් 3 ක ඒකක අලෙවි බද්දක් පැනවුවහොත් සමතුලිත මිලට හා ප්‍රමාණයට වන බලපෑම ගනනය කරන්න. (ලකුණු 2)

   ඈ. අලෙවි බඳු පැනවීම නිසා පාරිභෝගික අතිරික්තයෙහි හා නිෂ්පාදන අතිරික්තයෙහි ඇති වන වෙනස ගනනය කරන්න. (ලකුණු 3)

   ඉ. අලෙවි බඳු පැනවීම වෙනුවට රජය විසින් මෙම භාණ්ඩය සඳහා රුපියල් 3 ක ඒකක සහනාධාරයක් ලබාදෙන්නේ නම්, එමගින් සමතුලිත මිලට, ප්‍රමාණයට සහ මුලු අතිරික්තයට වන බලපෑම ගනනය කරන්න. (ලකුණු 5)

   ii. පහත සඳහන් සංකල්පයන් නිර්වචනය කරන්න.

   අ. මිල ඉල්ලුම් නම්‍යතාවය

   ආ. ආදායම් ඉල්ලුම් නම්‍යතාවය

   ඇ. හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය (එක් කොටසකට ලකුණු 2 කි)

   iii. සාමාන්‍ය සහ බාල භාණ්ඩයක මිල වැඩිවීම නිසා ඇතිවන ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. (ලකුණු 5)

3. i. නිෂ්පාදනය තුල කෙටිකාලය හා දිගුකාලය අතර වෙනස දක්වන්න. (ලකුණු 2)

ii. යෙදවුමක ඵලදාව හා පරිමාණානුකූල ඵල (returns to an input and returns to scale) අතර වෙනස කුමක්ද? (ලකුණු 2)

iii. පහත සඳහන් සංකල්පයන් නිර්වචනය කරන්න.

අ. සාමාන්‍ය ඵලදාව
ආ. ආන්තික ඵලදාව
ඇ. සාමාන්‍ය පිරිවැය
ඈ. ආන්තික පිරිවැය (එක් කොටසකට ලකුණු 2 කි)

iv. එකම රූප සටහනක මුළු පිරිවැය (TC), මුළු ස්ථාවර පිරිවැය (TFC) සහ මුළු විචල්‍යය පිරිවැය (TVC) වක්‍රයන් අඳින්න. එම සෑම වක්‍රයකම හැඩයට බලපාන ප්‍රධාන හේතු හඳුනාගන්න. (ලකුණු 3)

v. සුදුසු රූප සටහන් භාවිතා කොට කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයක පවත්නා අධියරයන් තුන හඳුනාගන්න. (ලකුණු 3)

vi. එකම රූප සටහනක සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය (AVC), සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය (AFC), සාමාන්‍ය පිරිවැය වක්‍රය (AC) හා ආන්තික පිරිවැය (MC) වක්‍රයන් අඳින්න (ලකුණු 3)

vii. AC වක්‍රය අවම වන ලක්ෂයට වමින් පිහිටි ලක්ෂයකදී MC වක්‍රය අවම වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)

viii. සුදුසු රූප සටහන් භාවිතා කොට, කෙටිකාලයේදී සාමාන්‍ය විචල්‍යය පිරිවැය සහ සාමාන්‍ය ඵලදාව අතර පවත්නා සම්බන්දතාවය පැහැදිලි කරන්න. (ලකුණු 2)

4. i. උද්ධමනයට අදාලව පහත සඳහන් සංකල්පයන් පැහැදිලි කරන්න.

අ. මිල ප්‍රතිවිපාක (price effects)
ආ. ආදායම් ප්‍රතිවිපාක (income effects)
ඇ. ධනය මත ඇතිකරන්නා වූ ප්‍රතිවිපාක (wealth effects) (එක් කොටසකට ලකුණු 2 කි)

ii. සේවා වියුක්තියෙහි විවිධ ස්වරූපයන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. සුදුසු රූප සටහන් භාවිතා කොට ව්‍යාපාර චක්‍ර වල පවත්නා අධියරයන් හඳුනාගන්න (ලකුණු 2)

iv. ජීවන තත්ත්වය මැනීම සඳහා මූර්ත ඒක පුද්ගල ආදායම හොඳ මිනුම් දඬුවක් නොවන්නේ ඇයිද යන්නට හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 2)

v. පහත සඳහන් සංකල්පයන් අතර වෙනස හඳුනාගන්න.
අ. මුළු පෞද්ගලික ආදායම හා වැයකල හැකි ආදායම.
ආ. වෙළඳපොළ මිල සහ මූලික මිල.
ඇ. ශුද්ධ අපනයන හා විදේශ ශුද්ධ සාදක ආදායම.
ඈ. පෞද්ගලික ඉතුරුම් සහ රජයේ ඉතුරුම්. (එක් කොටසකට ලකුණු 2 කි)

vi. ලංකාවේ ජාතික ගිණුම්කරණ පද්ධතිය තුල මෑත කාලයේදී සිදු කරන ලද වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 3)

5. i. පහත සඳහන් තොරතුරු මඟින් පැහැදිලි කරනු ලබන ආර්ථිකයක් පිලිබඳව සලකා බලන්න (සියළු අගයන් රු. වලිනි).

| | |
|---|---|
| පාරිභෝජන ශ්‍රිතය | $C = 100 + 0.8 Y^d$ |
| ආයෝජනය | $I = 150$ |
| බදු අනුපාතය | $t = 5\ \%$ |
| සංක්‍රාම | $TR = 100$ |
| රජයේ වියදම | $G = 250$ |
| ශුද්ධ අපනයන | $Nx = 140$ |

අ. MPC, APC, MPS සහ APS අර්ථ දක්වන්න.
ආ. සමතුලිත ආදායම් මට්ටම ගනනය කරන්න.
ඇ. ගුණකයේ අගය ගනනය කොට එය අර්ථ දක්වන්න.
ඈ. රාජ්‍ය අයවැය හිඟය හෝ අතිරික්තය ගනනය කරන්න.
ඉ. සමතුලිත ආදායම් මට්ටමේ දී පාරිභෝජන වියදම ගනනය කරන්න.
ඊ. පූර්ණ සේවා නියුක්ති මට්ටම රුපියල් 3500ක් වන්නේ නම් එය ළඟාකර ගැනීම සඳහා කොපමන ප්‍රමානයකින් රජයේ වියදම හෝ ආයෝජනය වැඩි කල යුතුද?
එ. රූප සටහනක සමතුලිත ආදායම් මට්ටම පෙන්වන්න. (එක් කොටසකට ලකුණු 3 කි)

ii. මුදල් සැපයුමේ වැඩි කිරීමක් උද්ධමනකාරි වන්නේ කුමන තත්ත්වයක් යටතේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 4)

6. පහත සඳහන් ඒවායෙන් ඕනෑම **පහක්** පිළිබඳව කෙටියෙන් පැහැදිළි කරන්න.
(එක් කොටසකට ලකුණු 5 කි)

i. ශ්‍රී ලංකාවේ රාජ්‍යය ණය (public debt in Sri Lanka)
ii. ශ්‍රී ලංකාවේ විදේශ ශුද්ධ සාධක ආදායම්
iii. ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම්කරණ පද්ධතිය තුල පවත්නා ගැටළු
iv. මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තීන් (fiscal and monetary policies)
v. සේවා වියුක්තියෙහි පිරිවැය
vi. මුදලෙහි කාර්යයන් (functions of money)
vii. ආර්ථික වෘද්ධිය තීරනය කරනු ලබන සාධක (determinants of economic growth)